# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2024 අංක 14 දරන
# දස්සනා බෞද්ධ සංවිධානය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 මාර්තු මස 15 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 තැපැල් ගාස්තුව **:** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2024 අංක 14 දරන දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.– ඕ. (අයි. එන්. සී.) 8/2021

**දස්සනා බෞද්ධ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"දස්සනා බෞද්ධ සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංවිධානයක්, එකී සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී සංවිධානය හා සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංවිධානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම්කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2024 අංක 14 දරන දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) දස්සනා බෞද්ධ සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "දස්සනා බෞද්ධ සංවිධානය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය. දස්සනා බෞද්ධ සංවිධානය සංස්ථාගත කිරීම

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ කර ගත යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

3. සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ—

(අ) බෞද්ධ අනුගාමිකයන් සඳහා සතර සතිපට්ඨාන භාවනා වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම;

(ආ) දාන, සීල, භාවනා වැඩසටහන් සංවිධානය කිරීම මගින් ථේරවාදී බුදු දහමේ පණිවිඩය වන සිත පිරිසිදු කිරීමේ ක්‍රියාකාරකම් සමාජය තුළ ව්‍යාප්ත කිරීම;

(ඇ) බැබලාගම නාගලෙන් රජමහා විහාරයේ වාසය කරන භික්ෂූන් වහන්සේලාට, දසසිල් මාතාවන්ට, උපාසක, උපාසිකාවන්ට දානය සහ අනෙකුත් අවශ්‍යතා සැපයීමට කටයුතු කිරීම; සහ

(ඈ) ථේරවාදී බුදු දහම ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ආගමික සහ සංස්කෘතික වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම,

විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක කටයුතු සමග ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

4. සංස්ථාපිත මණ්ඩල විසින් ස්වකීය පරමාර්ථ, ලිඛිත නීතියට අනුකූලව සහ ආණ්ඩුවේ හෝ පළාත් සභාවක කිසියම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් ඊට සමගාමීව කරගෙන යන්නා වූ යම් කටයුතු අතර කිසිදු ගැටුමක් ඇති නොවන ආකාරයකින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධාන සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත් ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් ධුර දරන නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මකවීම අරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ සංවිධානයේ ධුර දරන මණ්ඩලය (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමු මණ්ඩලය පත් කරගනු ලබන තෙක් හෝ තෝරා පත්කරගනු ලබන තෙක් සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලය ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමට බලය තිබිය යුතු ය.

(ඇ) අතුරු මණ්ඩලයේ යම් තීරණයක් එහි පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ආරම්භවන දින සිට වසරක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ පළමු මණ්ඩලය පත් කරනු ලැබිය යුතු ය; නැතහොත් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරයන් සහ උපදේශකවරයන් ඇතුළුව මණ්ඩලයේ සෑම ධුර දරන්නකු ම වසර තුනක කාලසීමාවක් සඳහා පත් කරගැනීම හෝ තෝරා පත් කරගැනීම කළ යුතු අතර, එකී වසර තුනක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව එවැනි සෑම ධුර දරන්නකු ම, අනුශාසකවරයකු ම හෝ උපදේශකවරයකු ම නැවත පත් කරගැනීම හෝ නැවත තෝරාපත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) සාමාජිකයකු මියයෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී,

මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා ගනු ලබන හෝ තෝරා පත්කර ගනු ලබන තැනැත්තා විසින්, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා, පහත සඳහන් ක්‍රියා කිරීමට, ඉටුකිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලයට බලය තිබිය යුතු ය:—

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි වූ පරිදි, යම් සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට සෘජුව හෝ තත් කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම සහ ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති නීත්‍යානුකූල භාරයක් හෝ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම, හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ට යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ දී සහ විදේශ රටවල දී නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

7. (1) සංස්ථාපිත මණ්ඩලය විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා කලින් කලට සෑදීම නීත්‍යනුකූල විය යුතු යː-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපා හැරීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම් නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය සහ කාර්ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ එකී රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) මණ්ඩලයේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා වන සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීමේ ආකාරය පාලනය කරනු ලබන කාර්ය පටිපාටිය; සහ

(උ) සාමාන්‍යයෙන් "සංස්ථාපිත මණ්ඩලයේ" කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, ඒ රීති සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සියලු අවස්ථාවන්හි දී සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

**8.** මණ්ඩලය විසින්, සාමාජිකයන්ගේ නම, ලිපිනය, සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය. සාමාජික නාමලේඛනය

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලය වෙනුවෙන්, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල්, 6(ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් අනුමත කළ බැංකුවක හෝ ඊට වැඩි බැංකු සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව යටතේ විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කළ යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කළ යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තකු; හෝ

(ආ) එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තා

**11.** (1) මණ්ඩලය විසින් එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ 10 වන වගන්තියේ සඳහන්

කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සහ සංස්ථාපිත මණ්ඩලයේ සියලු වත්කම් සහ වගකීම් පිළිබඳ ලැයිස්තුවක් ද සමග ඒ වාර්තාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ බුද්ධ ශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළැඹෙන වර්ෂයේ සය මසක් ඉකුත්වීමට පෙර භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ සංස්ථාපිත මණ්ඩලය වෙත විදේශීය හා දේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක්, සංස්ථාපිත මණ්ඩලය විසින් එළඹෙන ලද සියලු ගිවිසුම් සහ එකඟතා පිළිබඳ විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීති අමුණා තිබිය යුතු ය.

**12.** මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානය විසින් ගෙවිය යුතු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ සංවිධානයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවිය යුතු ය.

සංවිධානය විසින් ගෙවිය යුතු සහ සංවිධානයට අයවිය යුතු ණය

**13.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය තිබිය යුතුය. එසේම එවැනි සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමට බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා ම පමණක් අදාළ කරගත යුතු අතර, ඉන් කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් හෝ කවර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට සෘජුව හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කිසියම් සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි මණ්ඩලයේ ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් වන්නා වූ ද, වෙනත් ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අවශ්‍යතා සපුරාලීමට නොහැකි වන අවස්ථාවක දී ඉතිරි වන දේපළ අවස්ථානුකූලව, (88 වන අධිකාරය වූ) මහා භාරකාර ආඥාපනතේ විධිවිධාන අනුව මහා භාරකාරවරයාට හෝ ඒකාබද්ධ අරමුදලට පවරනු ලැබිය යුතු ය.

(3) ඉතිරි වන දේපළ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ පවරනු ලබන ආකාරය, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය

ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් මහා සභා රැස්වීමක දී ඊට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** මේ පනතේ ඇතුළත් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.